# (ඇ) රැකී රක්‍ෂා සහ කම්කරු සම්බන්ධතා

**රැකී රක්‍ෂා**

ලංකාවේ රක්‍ෂා විරක්‍ෂා තත්ත්වය පිළිබඳ වාර්ෂිකව තොරතුරු ලබාගත හැක්කේ නොවේ. වාර්ෂිකව සංඛ්‍යා තොරතුරු නොමැති නිසා විරක්‍ෂා තත්ත්වයෙහි වාර්ෂිකව ඇතිවන වෙනස්කම් දැන ගත හැක්කේ රැකී රක්‍ෂා කාර්යාලවල ලියා පදිංචි වී ඇති අයගේ සංඛ්‍යා වලිනි. 1963 අවසානයේදී රැකී රක්‍ෂා කාර්යාලවල ලියා පදිංචි වී සිටිය ගණන පසුගිය වසරේදීට වඩා සියයට 0.2 කින් අඩු විය. මේ සංඛ්‍යා 1964 තෙවැනි හා සිව්වැනි කාර්තුවලදී වේගයෙන් වැඩි විය. මේ අනුව 1964 දෙසැම්බර් අවසානය වන විට ලියා පදිංචිවූවන්ගේ මුළු ගණන 165456 ක් විය. 1963 දෙසැම්බර් අවසානය වන විට එය 151922 ක් විය. වර්ෂය තුලදී කාර්මික හා ලිපිකරු රක්‍ෂා සඳහා ලියා පදිංචි වූවන්ගේ සංඛ්‍යාව වැඩිවූයෙන්, වර්ෂය අවසානය වනවිට එසේ ලියා පදිංචි වූවන්ගේ සංඛ්‍යාව 1963 දෙසැම්බර් අවසානයේ සංඛ්‍යාවට වඩා සියයට 14.7 කින් වැඩි විය. ලියා පදිංචි වූ පුහුණු, අර්ධ පුහුණු හා නුපුහුණු අයගේ සංඛ්‍යාව 1963 දෙසැම්බර් අවසානයේ සංඛ්‍යාවට වඩා පිළිවෙලින් සියයට 8.2 කින් සියයට 5.3 කින් හා සියයට 7.9 කින් වැඩි විය. 1964 දී රාජ්‍ය අංශයේ අර්ධ රාජ්‍ය සංස්ථාවල හා පෞද්ගලික අංශයේ අලුතෙන් ඇති වූ රැකියාවන් පිළිබඳ පූර්ණ සංඛ්‍යා තොරතුරු ලැබී නැත.

මෑත වර්ෂවලදී රැකීරක්‍ෂා ලබාදුන් අයගේ ගණනද, පොත්වල ඒ ඒ වර්ගයෙන් ලියා පදිංචිවී ඇති මුළු ගණනට එහි ඇති සියයට ගණනද පහත සටහනේ දක්වා ඇත.

සංඛ්‍යා සටහන II (ඇ) – 1

**රැකියා ලබාදුන් සංඛ්‍යා හා ඒ ඒ වර්ගයෙන් ලියා පදිංචි වී ඇති සංඛ්‍යාවට එහි ඇති සියයට ගණන.**

| වර්ෂය | කාර්මික හා ලිපිකරු | % | පුහුණු | % | අර්ධ පුහුණු | % | නුපුහුණු | % | එකතුව | % |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| 1955 | 2,166 | 14·9 | 1,064 | 12·5 | 1,187 | 5·9 | 3,791 | 13·6 | 8,208 | 11·6 |
| 1956 | 1,913 | 11·9 | 845 | 8·6 | 1,565 | 6·1 | 4,162 | 12·1 | 8,485 | 9·9 |
| 1957 | 1,176 | 6·3 | 709 | 5·3 | 1,180 | 3·8 | 3,053 | 6·4 | 6,118 | 5·5 |
| 1958 | 1,827 | 9·2 | 800 | 5·9 | 1·006 | 3·1 | 2,251 | 4·4 | 5,884 | 5·0 |
| 1959 | 1,667 | 8·0 | 1,045 | 7·5 | 1,275 | 3·8 | 3,218 | 5·4 | 7,205 | 5·6 |
| 1960 | 1,400 | 5·3 | 771 | 4·6 | 1,247 | 3·6 | 4,744 | 6·5 | 8,162 | 5·4 |
| 1961 | 1,259 | 4·6 | 631 | 3·5 | 964 | 2·8 | 2,794 | 3·9 | 5,648 | 3·7 |
| 1962 | 1,263 | 3·7 | 468 | 2·7 | 809 | 2·3 | 2,315 | 3·5 | 4,857 | 3·2 |
| 1963 | 1,322 | 3·7 | 502 | 3·0 | 839 | 2·3 | 2,466 | 3·9 | 5,129 | 3·4 |
| 1964* | 1,722 | 4·2 | 535 | 3·0 | 945 | 2·5 | 3,599 | 5·3 | 6,801 | 4·1 |

* තාවකාලිකයි.

සංඛ්‍යා: කම්කරු දෙපාර්තමේන්තුවෙනි.

1964 දී රැකියා ලබා දුන් අයගේ සංඛ්‍යාව මෑත වර්ෂවලදීට වඩා සැහෙන තරමකින් වැඩිවී ඇත. වැඩි වශයෙන්ම රැකියා ලබාදී ඇත්තේ නුපුහුණු ගණයේ අයටය. ලියා පදිංචි වී ඇති මුළු ගණනින් වැඩිම සියයට ගණන, එනම් සියයට 5·3 ට රැකියා ලැබී ඇත්තේ මේ ගණයේ අයටය. කාර්මික හා ලිපිකරු වෘත්තීන් සඳහා ලියා පදිංචි වී ඇති අයගෙන් රැකියා ලබා දී ඇති අයගේ සියයට ගණන ඊට කිට්ටුවම දෙවැනි තැන ගනී. මෙසේ රැකියා ලබාදී ඇති අයගේ සියයට ගණන් සාමාන්‍යයෙන් පසුගිය වසරේ සියයට ගණන් වලට වැඩි හෝ සමාන හෝ වෙයි.

**කම්කරු සම්බන්ධතා**

සේව්‍ය සේවක සම්බන්ධතාවල ඇතිවූ වෙනස්වීම් වැඩ වර්ජන පිළිබඳ සංඛ්‍යා තොරතුරු වලින් එක්තරා ප්‍රමාණයකට පිළිබිඹු වෙයි. වැඩ වර්ජන ගණන හා වර්ජන වලට හවුල් වූ සේවකයන් ගේ ගණන සහ ඉන් නැතිවූ මිනිස් දවස් ගණන පහත එන සංඛ්‍යා සටහනේ දක්වේ.

සංඛ්‍යා සටහන II (ඈ) 2

වැඩ වර්ජන

| වර්ෂය | වැවිලි | | | වෙනත් රැකියාවන් | | |
|---|---|---|---|---|---|---|
| | වැඩ වර්ජන ගණන | සම්බන්ධවූ කම්කරුවන් | නැතිවූ මිනිස්දවස් | වැඩ වර්ජන ගණන | සම්බන්ධවූ කම්කරුවන් | නැතිවූ මිනිස් දවස් |
| 1955 | 160 | 1,143 | 69,913 | 47 | 11,293 | 36,016 |
| 1956 | 99 | 56,908 | 2,00,888 | 115 | 31,852 | 1,52,966 |
| 1957 | 177 | 2,97,061 | 6,18,050 | 127 | 70,239 | 1,90,443 |
| 1958 | 123 | 39,372 | 3,40,632 | 96 | 42,713 | 3,99,228 |
| 1959 | 177 | 47,318 | 3,52,095 | 71 | 42,453 | 4,60,141 |
| 1960 | 123 | 42,528 | 2,59,948 | 37 | 4,839 | 15,139½ |
| 1961 | 90 | 29,223 | 3,17,866 | 39 | 38,013 | 1,70,372 |
| 1962 | 138 | 42,569 | 1,93,792 | 50 | 25,730 | 8,01,882 |
| 1963 | 174 | 62,511 | 3,59,905 | 58 | 29,819 | 4,79,678 |
| 1964* | 178 | 61,529 | 5,54,953 | 82 | 16,887 | 2,13,514 |

* තාවකාලිකයි.

සාධ්‍යා—කම්කරු දෙපාර්තමේන්තුවෙනි.

1964 දී වතුකරයේ ඇතිවූ වැඩ වර්ජන ගණන 1963 දීට වඩා සුළු ප්‍රමාණයකින් වැඩිවිය. එහෙත් අනෙක් වෘත්තීන්හි පැවැති වැඩ වර්ජන ගණන සැලකිය යුතු ප්‍රමාණයකින් වැඩිවිය. වැඩිම වැඩ වර්ජන ගණන වාර්තාවී ඇත්තේ සංවිධානය වී ඇති සේවක සංඛ්‍යාවෙන් විශාල කොටසක් රැකියාවල නියුතු වතුකරයේය. 1964 දී වතුකරයේ වැඩ වර්ජන 178 ක්ද, අනෙක් වෘත්තීන්හි වැඩ වර්ජන 82 ක්ද, ඇතිවිය. 1963 දී මේ දෙඅංශයේ ඇතිවූ වැඩ වර්ජන ගණන, පිළිවෙළින් 174 ක් සහ 58 ක් විය. වැවිලි අංශයේ වැඩ වර්ජන වලට හවුල් වූ කම්කරුවන්ගේ සංඛ්‍යාව අඩුවුවද, ඉන් නැතිවී ගිය මිනිස් දවස් ගණන පසුගිය වසරට වඩා වැඩිවිය. අනෙකුත් වෘත්තීන්හි වැඩ වර්ජන වලට හවුල් වූ සේවක සංඛ්‍යාව හා නැතිවූ මිනිස් දවස් ගණන අඩු විය.

1964 වතුකරයේ වැඩ වර්ජන සාමාන්‍යයෙන් දින 9·0 ක් පැවැතියේය. 1963 දී මෙය දින 5.8 ක් විය. අනෙකුත් වෘත්තීන්හි වැඩ වර්ජන සාමාන්‍යයෙන් වතුකරයේ වැඩ වර්ජනවලට වඩා දිග්ගැස්සී ගියේය. එහෙත් මේ වැඩ වර්ජන පැවැති සාමාන්‍ය කාලය 1963 දී දින 16·1 ක් වුවද 1964 දී දින 12·6 දක්වා අඩුවූයේය.

වැඩ වර්ජනවලට හේතු වශයෙන් කම්කරු දෙපාර්තමේන්තුවෙන් වර්ග කොට දක්වා ඇති කරුණු අනුව, වැඩ වර්ජනවලින් සියයට 29·6 ක්ම හටගෙන ඇත්තේ රැකියාවෙන් නෙරපීම නිසා හෝ රැකියා නැතිවීම හේතුකොට ගෙනය. සියයට 26·9 ක් වතු නීති, විනය හා වැඩ පිළියෙල කිරීම් ආදිය හේතුකොට ගෙන ඇතිවූ අතර සියයට 11·9 ක් පඩි නොගෙවීම හෝ ගෙවීමට පමාවීම වැනි වැටුප් ආරාවුල් නිසා ඇති විය. මෙම වැඩ වර්ජන ප්‍රධාන වශයෙන්ම ඇතිවූයේ වතුකරයේය. වැඩ වර්ජනවලින් සියයට 9·6 ක් පොදු ඉල්ලීම් හේතුකොටගෙන ඇතිවිය. පඩි වැඩි කරන ලෙස කරන ලද ඉල්ලීම් හේතුකොටගෙන පැන නැගි වැඩවර්ජන ගණන සාපේක්ෂක වශයෙන් අඩුවූයේ මුළු වැඩ වර්ජන සංඛ්‍යාවෙන් සියයට 2·3 ක් විය. එවැනි වැඩ වර්ජන ඇතිවූයේ ප්‍රධාන වශයෙන්ම වැවිලි නොවන අංශයෙහිය.